## කෘෂි නිෂ්පාදනය

තේ කර්මාන්තය 1976 වර්ෂයේ පැවති පහත් නිෂ්පාදන මට්ටමෙන් මිදී මඳක් ඉදිරියට ඒමත්, වී නිෂ්පාදනයේ ඉහල යාම සහ පොල් නිෂ්පාදනය තියුණු ලෙස පහත වැටීමත්, 1977 වර්ෂය තුල කෘෂිකාර්මික අංශයේ දැකිය හැකි වූ වැදගත් ලක්‍ෂණ විය. තේ සහ වී අංශයන්හි නිෂ්පාදනයේ මෙම වැඩිවීමට බලපෑ ප්‍රධාන සාධකය වූයේ 1977 වර්ෂය තුල පැවති යහපත් කාලගුණ තත්ත්වයයි. 1976 වර්ෂය තුල පැවති අයහපත් කාලගුණ තත්ත්වය 1977 වර්ෂය තුලදී පොල් නිෂ්පාදනය කෙරේ අහිතකර ලෙස බල පා ඇත. තේ නිෂ්පාදනය ඉහල නැගීමෙනුත්, රබර් නිෂ්පාදනය අඩුතරමින් එම තත්වයේම වාගේ පැවතීමෙනුත්, පැහැදිළි වන්නේ 1975 අග භාගයේ දෙවැනි ඉඩම් ප්‍රතිසංස්කරණයෙන් සිදුවූ නොවැලැක්විය හැකි කෙටිකාලීන අවුල් සහගත තත්ත්වයෙහි බලපෑම තරමක් දුරට හෝ අඩුකිරීමට වර්ෂය තුල පැවති සතුටුදායක ඉහල මිල ගණන් සමත් වූ බවය.

1977 වර්ෂයේදී කෘෂිකාර්මික අංශය පිළිබඳව වැදගත් ප්‍රතිපත්තිමය තීරණ කීපයක් රජය විසින් ගන්නා ලදී. පළමුව, කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය.යටතේ තිබූ විශාල රාජ්‍ය වතු පාලන ආයතන වන ජනවසම හා උසවසම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතට මාරු කරන ලදී. ඉහල ඵලදායිතාවකින් යුතු තේ හා රබර් අක්කර විශාල ප්‍රමාණයක පාලන වගකීම අමාත්‍යාංශ දෙකක් අතර බෙදී යාමේදී ඇතිවන, ඒකාබද්ධ ප්‍රයත්නයක් දැරීමට ඇති අපහසුතාවය මෙ මගින් වැළැක්විනි. පසුව උසවසම අහෝසි කොට ඒ මගින් පාලනය කරන ලද ඉඩම් ජනවසම සහ රාජ්‍ය වැවිලි සංස්ථාව අතර බෙද හරින ලදී. දෙවනුව, ව්‍යාප්තික පදනමකින් කෘෂිකාර්මික කටයුතු ගැන සොයා බැලීම පිණිස කෘෂිකාර්මික ඵලදවර්ධන නීතිය යටතේ පිහිට වූ කෘෂිකාර්මික ඵලදවර්ධන කමිටුවල සාමාජිකයින් වෙනුවට තාවකාලික වශයෙන් රජයේ නිලධාරීන් පත් කරන ලදී. එසේ කරන ලද්දේ එවැනි කමිටු සාමාජිකයින් තෝරාපත් කිරීමේ අවසාන බලාපොරොත්තු ඇතිවය. මේ හැර කෘෂි පදනමේ තවදුරටත් ආයතනික වෙනස්කම් ඇති කිරීමට බලාපොරොත්තුවේ. තෙවනුව, 1977/78 මහ කන්නය සඳහා සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ කෘෂිකාර්මික ණය දීම පිළිබඳ කොන්දේසි බොහෝ සේ ලිහිල් කරන ලදී. මෙහිදී ඇතිවන ණය ආපසු අයකර ගැනීමේ ප්‍රශ්නය පිළිබඳව දැනට සලකා බලාගෙන යනු ලැබේ. සිව්වනුව, වී සඳහා රජය විසින් ගෙවන සහතික මිල 1977 නොවැම්බර් මාසයේ සිට බල පවත්වන පරිදි බුසලකට රුපියල් 33 සිට රුපියල් 40 දක්වා වැඩි කරන ලදී. පස්වනුව, 1978 වර්ෂය සඳහා බලා-පොරොත්තු වන ඉතාමත් සතුටුදායක වි නිෂ්පාදනය ගැන සලකා වී/සහල් ගබඩා කිරීමේ පහසුකම් සහ වී කෙටීමේ ධාරිතාව පුළුල් කිරීම පිළිබඳව රජය විසින් ඉහල ප්‍රමුඛත්වයක් දෙනු ලැබීය. වී මිලදී ගන්නා වූ වී අලෙවි මණ්ඩලයත් සහල් මිලදී ගන්නා වූ ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවත්, අතර වඩා සමීප සම්බන්ධතාවයක් දැනට පවතී. සයවනුව, කැපී පෙනෙන වාරික ලක්‍ෂණ වලින් යුතු මිරිස් වැනි අතිරේක ආහාර භෝගයන් සඳහා ස්වාරක්‍ෂක තොග පවත්වා ගෙන යාම මගින් නිෂ්පාදක හා පාරිභෝගික මිල උච්චාවචන අඩු කරලීම ප්‍රතිපත්තියක් ලෙස පිළිගෙන ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් එවැනි ද්‍රව්‍යයන් ආනයනය කිරීම නැවත ආරම්භ කරන ලදී.

එතෙක් පැවති ද්වික විනිමය අනුපාතික ක්‍රමයේ පහත් අනුපාතිකය යටතේ ව්‍යාපාරික කටයුතු කළ තේ, රබර් හා පොල් කර්මාන්තවලට 1977 නොවැම්බර් වලදී විනිමය අනුපාතිකය ඒකීය මට්ටමකට ගෙන ඒම නිසා විශාල ලෙස හදිසි ලාභ ලැබීමට හැකි තත්ත්වයක් ඇතිවිණි. එසේ වුවද, ඒ හා සමගම වැවිලි භෝග සඳහා වැඩි කරන ලද අපනයන බදු නිසා මෙම හදිසි ලාභවලින් සෑහෙන කොටසක් අඩු කෙරිණි. මේ අතරම, රජය මගින් දෙනු ලැබූ සහනාධාරය සියයට 50 සිට 75 දක්වා වැඩි කිරීමෙන් විනිමය වෙනස්කම් ඇතිකිරීම නිසා පොහොරවල දේශීය මිල ගණන්හි වූ වැඩිවීම රජය විසින්ම දරනු ලැබීය.

පසුගිය දශකය තුල තේ, රබර්, පොල් සහ වී යන ප්‍රධාන භෝගයන් පිළිබඳ මූලික දර්ශක 5 වැනි සංඛ්‍යා ලේඛනයෙහි දක්වා ඇත.

## 5 වැනි සංඛ්‍යා සටහන

### ප්‍රධාන කෘෂිකාර්මික භෝග පිළිබඳ දත්ත, 1968—1977

| | 1968 | 1969 | 1970 | 1971 | 1972 | 1973 | 1974 | 1975 | 1976(අ) | 1977 (අ) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **නිෂ්පාදනය** | | | | | | | | | | |
| තේ (රාත්තල් දශලක්ෂ) .. | 496 | 484 | 468 | 480 | 471 | 466 | 450 | 471 | 433 | 460 |
| රබර් (රාත්තල් දශලක්ෂ) . | 328 | 333 | 351 | 312 | 309 | 341 | 291 | 328 | 335 | 333 |
| පොල් (ගෙඩි දශලක්ෂ) .. | 2,601 | 2,440 | 2,510 | 2,610 | 2,963 | 1,935 | 2,031 | 2,398 | 2,330 | 1,821 |
| වී (බුසල් දශලක්ෂ) .. | 64·6 | 65·9 | 77·4 | 66·9 | 62·9 | 62·9 | 76·8 | 55·3 | 60·0 | 80·4 |
| **අක්කර ගණන** | | | | | | | | | | |
| තේ – මුළු ප්‍රමාණය . | 597,490 | 596,514 | 597,499 | 597,171 | 597,645 | 598,740 | 598,466 | 597,691 | 594,481 | 598,000 |
| වාර්ෂිකව නැවත වගා කිරීම .. | 5,266 | 6,500 | 6,857 | 6,640 | 6,418 | 5,953 | 4,282 | 4,356 | 2,756 | 3,067 |
| සමුච්චිත නැවත වගා කිරීම .. | 26,928 | 33,428 | 40,285 | 46,925 | 53,343 | 59,296 | 63,578 | 67,934 | 70,690 | 73,757 |
| රබර් – මුළු ප්‍රමාණය .. | 569,207 | 568,633 | 568,900 | 567,994 | 567,060 | 565,030 | 563,406 | 562,494 | 560,872 | 559,850 |
| කිරි කැපෙන බිම් ප්‍රමාණය . | 488,121 | 493,712 | 496,210 | 494,355 | 491,324 | 475,529 | 475,165 | 477,110 | 474,626 | 469,626 |
| වාර්ෂික නැවත වගා කිරීම .. | 13,047 | 12,084 | 10,214 | 8,476 | 8,722 | 4,964 | 7,076 | 7,980 | 6,298 | 6,464 |
| සමුච්චිත නැවත වගා කිරීම .. | 264,042 | 276,126 | 286,340 | 294,816 | 303,538 | 308,502 | 315,578 | 323,558 | 329,856 | 336,320 |
| පොල් – මුළු ප්‍රමාණය (1962) .. | (1,152,418) | | | | | | | | | |
| වී – මුළු ගණන (අක්කර '000) .. | 1,742 | 1,709 | 1,876 | 1,794 | 1,795 | 1,792 | 2,038 | 1,719 | 1,789 | 2,046 |
| අස්වැන්න නෙලාගත් බිම් ප්‍රමාණය '000 .. | 1,634 | 1,539 | 1,776 | 1,714 | 1,579 | 1,660 | 1,969 | 1,476 | 1,570 | 1,933 |
| දියුණු කළ වර්ග යටතේ බිම් ප්‍රමාණය '000 .. | 1,083 | 1,108 | 1,325 | 1,204 | 1,252 | 1,284 | 1,647 | 1,285 | 1,381 | — |
| **අක්කරයක ඵලදාව** | | | | | | | | | | |
| තේ .. .. | 830·1 | 811·4 | 811·0 | 833·0 | 816·0 | 805·0 | 882·0 | 920·0 | 839·1 | 899·5 |
| රබර් .. .. | 671·7 | 673·5 | 707·2 | 657·0 | 658·0 | 694·0 | 634·0 | 691·1 | 705·0 | 708·8 |
| පොල් .. .. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො | ලැ.නො. | ලැ.නො. | ලැ.නො | ලැ.නො. | ලැ.නො. | ලැ. නො: |
| වී .. .. | 46·49 | 50·33 | 51·30 | 45·91 | 46·87 | 44·58 | 45·65 | 44·04 | 44·91 | 48·92 |

(අ) තාවකාලික

මූලයන්: තේ කොමසාරිස් දෙපාර්තමේන්තුව,
රබර් පාලක දෙපාර්තමේන්තුව,
ජන ලේඛණ හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව,
පොල් අලෙවි මණ්ඩලය,
ශ්‍රී ලංකා මහ බැංකුව.

**තේ**

1976 වර්ෂයේදී පැවැති නියඟයෙන් අහිතකර බලපෑම් ලත් තේ කර්මාන්තය, 1977 දී ප්‍රධාන වශයෙන්ම යහපත් කාලගුණ තත්ත්වයේ බලපෑම නිසා තරමක දියුණුවක් පෙන්නුම් කළේය. තේ නිෂ්පාදනය රාත්තල් දශලක්ෂ 433 සිට රාත්තල් දශලක්ෂ 460 දක්වා හෙවත් සියයට 6 කින් ඉහල නැගුණි. කෙසේ වුවද මෙම නිෂ්පාදන මට්ටම පසුගිය දශකය තුල වර්ෂ බොහොමයක පැවැති නිෂ්පාදනයට වඩා අඩුවන අතර, 1975 දී වාර්තාගත නිපැයුම වූ රාත්තල් දශලක්ෂ 503 ට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුය.

1976 දී තේ නිෂ්පාදනයේ අඩුවීමට උන්නතාංශ ගණයන් තුනෙහිම නිෂ්පාදනයේ පහත වැටීම හේතුවූ අතර 1977 දී මෙම උපනතිය ආපස්සට හැරුණි. පහත් බිම්හි තේ නිෂ්පාදනය සියයට 13 කින් වැඩි වූ අතර, එය මුළු නිෂ්පාදනය වැඩි වූ ප්‍රමාණයෙන් භාගයකටත් වඩා වැඩිවීමට හේතුවිය. උස්බිම්හි තේ නිෂ්පාදනය සියයට 4 කින් වැඩිවිය. 1976 තේ නිෂ්පාදනය පහත බැසීමේදී එම පහත වැටුන ප්‍රමාණයෙන් අඩකට මැදි බිම් තේ නිෂ්පාදනයේ පහත වැටීම වගකියූවද, මෙම වර්ෂයෙහිදී මෙම වර්ගයෙහි තේ නිෂ්පාදනය සියයට 3 කින් වැඩිවීමක් පෙන්නුම් කරයි.

පොහොර යෙදීම 1976 දී මෙට්‍රික් ටොන් 95,263 සිට 1977 දී මෙට්‍රික් ටොන් 80,394 දක්වා අඩුවුවද, තේ අක්කරයක ඵලදාව 1977 දී වැඩිවීමක් පෙන්වයි. වර්ෂය තුලදී මුහුණ පෑමට සිදුවූ සැපයුම් දුෂ්කරතා හේතු කොටගෙන තේ වගාව සඳහා පොහොර නිකුත් කිරීම අඩුවූ බව පැහැදිලි වශයෙන් කිව හැක. මෙම දුෂ්කරතා මධ්‍යයේ වුවද, තේ නිෂ්පාදනයෙහි ප්‍රගතියක් ඇතිවූයේ හිතකර කාලගුණ තත්වයන් සහ තියුණු ලෙස වැඩිවූ මිල ගණන් කෙරෙහි නිෂ්පාදකයින් දැක්වූ ප්‍රතිචාරය නිසා විය හැක.

1977 දී නැවත වගාකළ අක්කර ප්‍රමාණය 3,067 ක් වූ අතර මෙය 1976 දී ප්‍රමාණයට වඩා සියයට 11 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙම වැඩිවීම 1971 සිට නැවත වගා කළ අක්කර ප්‍රමාණය පහත බැසීමේ උපනතිය ආපසු හැරවීමට උපකාර වුවද, මෙය මෑත අතීතයේ නැවත වගා කළ අක්කර ප්‍රමාණයට මෙන්ම අපේක්ෂිත මට්ටමටද වඩා අඩුය. 1977 නොවැම්බර් මාසයේදී නැවත වගා කිරීමේ සහනාධාරය අක්කරයකට රුපියල් 4,500 සිට 6,000 දක්වා වැඩිකිරීම නිසා වාර්ෂික නැවත වගාකිරීමේ අක්කර ප්‍රමාණයෙහි වැඩිවීමක් බලාපොරොත්තු වියහැක. 1977 අවසානයේදී නැවත වගාකළ මුළු තේ අක්කර ප්‍රමාණය අක්කර 73,757 ක් වූ අතර, මෙය වගාකළ මුළු තේ අක්කර ප්‍රමාණයෙන් සියයට 12 ක් පමණ වේ. ආර්ථිකයෙහි ඉතා වැදගත් වන මෙම අංශයෙහි ඵලදායීතාවය වැඩිකිරීමෙහි අත්‍යාවශ්‍යතාවය ගැන සලකන විට මෙම තත්ත්වය එතරම් සතුටුදායක නොවේ. 1972 සහ 1975 දී ඉඩම් ප්‍රතිසංස්කරණ වලින් පසුව මුළු තේ ඉඩම් ප්‍රමාණයෙන් සියයට 63 ක් පමණ රජය වෙත පැවරිනි. මෙම තේ බිම් වලින් වැඩි කොටසක පාලනය දුන් රජයේ ආයතන වන ජනවසම සහ රාජ්‍ය වැවිලි සංස්ථාවට පැවරී ඇත. ජනවසම වතු පාලනය කිරීමට අමතරව 1977 අප්‍රේල් මාසයේදී ෂෝ වොලස් සහ හෙජස් සමාගම සතුවූ පොහොර ගබඩාවන් පවරා ගැනීමෙන් පසු පොහොර වෙළඳාමටද ඇතුල්විය. ජනවසම තමන් යටතේ ඇති වතු සඳහා අවශ්‍ය පොහොර සැපයීමෙන් පසුව, තම වැවිලි ප්‍රදේශ වලට ආසන්නව පිහිටා ඇති ග්‍රාමීය අංශයෙහිද පොහොර අවශ්‍යතාවයන්ගෙන් කොටසක් වත් සපුරාදීමට බලාපොරොත්තු වෙයි.

**රබර්**

1976 දී අක්කර 4,74,626 ක් වූ කිරි කපන බිම් ප්‍රමාණය 1977 දී අක්කර 4,69,626 දක්වා අඩුවීමේ හේතුවෙන් 1976 දී රාත්තල් දශලක්ෂ 335 ක් වූ රබර් නිෂ්පාදනය 1977 දී රාත්තල් දශලක්ෂ 333 දක්වා සුළු වශයෙන් අඩුවිය.

1976 දී නැවත වගා කළ බිම් ප්‍රමාණය අක්කර 6,298 ක් වූ අතර 1977 දී එය අක්කර 6,464 දක්වා වැඩි වී ඇත. ඉතා සුළු දියුණුවක් මෙයින් පෙන්නුම් කළද, රබර් ගසෙහි ආර්ථිකමය ජීවිත කාලය මත පදනම් කර පිළියෙල කරගත් වාර්ෂික ඉලක්කය වූ අක්කර 15,000 සමග සසඳන කල, මෙම නැවත වගා කරන ලද බිම් ප්‍රමාණය තවම ඉතා පහළ මට්ටමක පවතින බව පෙනේ. 1977 අවසන් වන විට නැවත වගා කර ඇත්තේ මුළු රබර් අක්කර ප්‍රමාණයෙන් සියයට 60 ක් නැතහොත් අක්කර 3,36,320 පමණි. රබර් සඳහා වැඩිවන දේශීය හා විදේශීය ඉල්ලුම් සැපිරීමට නම් දේශීය රබර් නිෂ්පාදනය දියුණු කිරීමට විශේෂ ප්‍රයත්නයක් ඉතා අවශ්‍යය. ඒ සඳහා වාර්ෂික නැවත වගා ඉලක්ක සාක්ෂාත් කරගත යුතු අතර, නව වගාවන් සඳහා පොහොර පාවිච්චිය වැඩි කිරීමත්, වගා ව්‍යාප්ති කටයුතු දියුණු කිරීමත් කළ යුතුවේ. 1977 නොවැම්බර් මාසයේදී නැවත වගා කිරීමේ සහනාධාරය අක්කරයකට රුපියල් 2 000 සිට රුපියල් 3,000 දක්වා වැඩි කිරීමත්, නව වගා සහනාධාරය අක්කරයකට රුපියල් 1,800 සිට 2,700 දක්වා වැඩි කිරීමත් දිගු කාලයේදී රබර් නිෂ්පාදනය වර්ධනය කිරීමෙහි ලා උපකාරී වේ යයි බලාපොරොත්තු වනු ලැබේ. කෙසේ වුවත්, රබර් වගාවෙන් වැඩි ප්‍රමාණයක් සාපේක්ෂ වශයෙන් කුඩා වතු වශයෙන් පාලනය වන නිසා මේ සම්බන්ධ විශේෂ උනන්දුවක් අවශ්‍ය වේ.

පොල්

1972 දී ගෙඩි දශලක්ෂ 2,963 දක්වා වැඩි වූ පොල් නිෂ්පාදනය එතැන් සිට උච්චාවචනය වෙමින් බැස යන උපනතියක් පෙන්නුම් කරයි. ඉකුත් වසරේදී ගෙඩි දශලක්ෂ 2,330 ක් වූ පොල් නිෂ්පාදනය 1977 දී ගෙඩි දශලක්ෂ 1,821 දක්වා විශාල වශයෙන් අඩු වූ අතර, මෙය 1968 න් පසු වාර්තා වූ අඩුම පොල් නිෂ්පාදනය වේ. නිෂ්පාදනය මෙසේ පහත වැටීමට ප්‍රධාන හේතුන් වූයේ 1975 හා 1976 දී නොකඩවා පැවති නියගයේ පසු බලපෑමත්, පොහොර පාවිච්චිය ක්‍රමයෙන් අඩුවීමත්ය. 1976 දී පාවිච්චියට ගත් පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 30,683 වූ අතර, 1977 දී එය මෙට්‍රික් ටොන් 1,499 කින් අඩුවී මෙට්‍රික් ටොන් 29,184 පමණක් විය.

1976 දී වාර්ෂිකව නැවත වගා කළ සහ අළුතින් වගා කළ පොල් අක්කර ප්‍රමාණය 13,110 ක් වූ අතර, 1977 දී එය අක්කර 13,671 දක්වා වැඩිවිය. මෙයින් පොල් වගාව දිගු කලක් තිස්සේ පැවති නියඟ තත්ත්වයෙන් මිදී සාමාන්‍ය තත්ත්වය කරා ගමන් කරන බව පෙන්නුම් කළද, 1972 දී නැවත වගා කළ හා අළුතින් වගා කළ අක්කර 18,800 සමග සසඳන කල 1977 වගා කළ ප්‍රමාණය ඉතාමත් පහත්ය. පොල් නිෂ්පාදනය පහත වැටීම නිසා පොල් සහ පොල්තෙල් මිල ඉහල යාම මගින් දේශීය වශයෙන් ජීවන වියදම ඉහල යාමට හේතු වූ අතර, පොල් නිෂ්පාදන කර්මාන්තයේ විදේශ විනිමය ඉපයීම් ධාරිතාව ද අඩු විණි. ඉකුත් වාර්ෂික වාර්තාවේ විශේෂයෙන් සඳහන් කළ පරිදි ඉහල ඵලදයි තාවයක් ලැබීම සඳහා පොල් වගා කළමනාකාරිත්වය විධිමත් කිරීම සඳහා වහාම සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීම අවශ්‍ය වේ,

වී

ජනලේඛන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවලට අනුව, 1977 වගා වර්ෂයේ (මහ 1976/77 සහ යල 1977) වී නිෂ්පාදනය බුසල් දශලක්ෂ 80·4 ක් විය. මෙය 1976 වර්ෂයේ නිෂ්පාදනයට වඩා (බුසල් දශලක්ෂ 20 කින් හෙවත් සියයට 34 කින්) ඉතා සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කරයි. මීට පෙර වාර්තාගත වූ වැඩිම නිෂ්පාදන ප්‍රමාණය වන 1970 වූ බුසල් දශලක්ෂ 77·4 ද ඉක්මවමින්, මෙම වර්ෂයේ නිෂ්පාදන ප්‍රමාණය මෙතෙක් වාර්තාගත වූ ඉහළම නිෂ්පාදන ප්‍රමාණය විය.

1977 වර්ෂයේ වී නිෂ්පාදනය මහ කන්නයේ බුසල් දශලක්ෂ 54·8 කින් හා යල කන්නයේ බුසල් දශලක්ෂ 25·6 කින් සමන්විත වේ. මෙම ප්‍රමාණයන් මෙම කන්න දෙක සඳහා වාර්තාගත වූ ඉහළම නිෂ්පාදන ප්‍රමාණයන් වේ. මෙම ඉහල නිෂ්පාදන ප්‍රමාණයට මහ සහ යල කන්න දෙකේම වැපුරූ හා අස්වනු නෙලා ගත් භූමි ප්‍රමාණය වැඩිවීම සහ ලබාගත්

වැඩි ඵලදාවන් හේතු විය. තවද, හිතකර කාලගුණ තත්ත්වයත්, මහවැලිය හැරවීම මගින් වියලි කලාපය තුල ජල සම්පාදනයේ වූ ස්ථාවරත්වය නිසාත්, පොහොර භාවිතයේ සැලකිය යුතු වැඩිවීමත්, නිෂ්පාදනයේ වැඩිවීමට හේතු විය.

1977 වර්ෂයේ ඇස්තමේන්තු කරනු ලැබූ දළ වැපුරූ බිම් ප්‍රමාණය අක්කර දශලක්ෂ 2·05 ක් වන අතර, එය ඉකුත් වර්ෂයට වඩා සියයට 14 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. 1975 වර්ෂයේ සිට 1976 වර්ෂය දක්වා වගා කළ බිම් ප්‍රමාණය වැඩිවූයේ සියයට 4 කින් පමණි. 1977 වර්ෂයේ අස්වනු නෙලාගත් ප්‍රමාණය අක්කර දශලක්ෂ 1·93 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. වපුරන ලද හා අස්වනු නෙලාගත් භූමි ප්‍රමාණය අතර වෙනස අක්කර 1,13,126 ක් හෙවත්, වපුල ප්‍රමාණයෙන් සියයට 6 ක් වේ. ඉකුත් වර්ෂයේ මෙම ප්‍රමාණය අක්කර 2,18,610 ක් හෙවත් වපුරන ලද ප්‍රමාණයෙන් අස්වනු නෙලා නොගත් ප්‍රමාණය සියයට 12 ක් විය. මෙයින් 1977 වර්ෂයේදී වගා පාළුව ඉකුත් වර්ෂයට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වූ බව පෙන්නුම් කරයි.

1977 වගා වර්ෂය සඳහා අක්කරයක සාමාන්‍ය ඵලදාව බුසල් 48·9 ක් වන අතර, මෙය ඉකුත් වර්ෂයේ අක්කරයක සාමාන්‍ය ඵලදාවට වඩා බුසල් 4 කින් වැඩිවීමකි.

කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයට අයත් ග්‍රාමීය ආයතන සහ ඵලදාවර්ධන නිති අංශය (ගොවිජන සේවා අංශය) මගින් වී සඳහා නිකුත් කළ පොහොර ප්‍රමාණය 1976 ටොන් 73,059 සිට 1977 දී ටොන් 80,123 දක්වා සියයට 10 ක වැඩිවීමක් පෙන්වන ලදි. ලංකා පොහොර සංස්ථාවට අනුව, 1977 වර්ෂයේදී වී සඳහා නිකුත් කර ඇති මුළු පොහොර ප්‍රමාණය ටොන් 1,23,810 ක් වේ. එය ඉකුත් වර්ෂයේ නිකුත් කළ ප්‍රමාණයට වඩා සියයට 77·4 ක සැලකිය යුතු වැඩිවීමක් පෙන්වයි. 1975 පොහොර මිල අඩු කිරීම කෙරෙහි ගොවියන්ගේ ධන ප්‍රතිචාරයත්, යහපත් කාලගුණ තත්ත්වය නිසා වගා කළ බිම් ප්‍රමාණය වැඩිවීමත්, විශේෂයෙන්ම වියලි කලාපයේ වාරිමාර්ග පහසුකම් වැඩිවීමත්, පොහොර භාවිතය වැඩිවීමට බල පෑ හේතුන් වේ.

1977 වර්ෂයේ වී අලෙවි මණ්ඩලය මගින් සහතික මිල ක්‍රමය යටතේ මිලදී ගත් වී ප්‍රමාණය බුසල් දශලක්ෂ 24·6 ක් වේ. මෙය 1976 වර්ෂයේ මිලදී ගත් ප්‍රමාණයට වඩා බුසල් දශලක්ෂ 11·8 ක හෙවත් සියයට 92 ක සැහෙන වැඩිවීමක් පෙන්වයි. 1977 මිලදී ගත් ප්‍රමාණය වර්ෂයේ මුළු වී නිෂ්පාදනයෙන් සියයට 31 ක් විය. මෙය 1976 වර්ෂයේ නිෂ්පාදනයෙන් මිලදී ගත් ප්‍රමාණය වූ සියයට 21 හා සසඳන විට සැලකිය යුතු දියුණුවකි. වී අලෙවි මණ්ඩලය, සිය ගබඩා, ප්‍රවාහන හා වී මෝල් පහසුකම් ප්‍රමාණවත් නොවීම වැනි සීමාවන් රාශියක් තිබියදීත්, 1977 වර්ෂය තුලදී වී මිලදී ගැනීම් වැඩිකර ගැනීමට සමත්ව ඇත.

වී අලෙවි මණ්ඩලය හා පෞද්ගලික අංශය සතු වී කෙටීමේ ධාරිතාව නිෂ්පාදනයේ වැඩිවීමට සරිලන අන්දමට ප්‍රමාණවත් නොවේ. වී අලෙවි මණ්ඩලයේ වී කෙටීමේ වර්තමාන ධාරිතාව මසකට වී ටොන් 12,000 ක් වන අතර, පෞද්ගලික අංශයේ කෙටීමේ ධාරිතාව මසකට වී ටොන් 42,850 ක් පමණ වේ. පෞද්ගලික අංශයේ ක්‍රියාකාරී ධාරිතාව මීට වඩා අඩු බව වාර්තාවන අතර, දිගු කාලයක් තිස්සේ වී කෙටීමේ යන්ත්‍ර නොසලකා හැර තිබීම ඊට හේතුව වී ඇත. වී අලෙවි මණ්ඩලය සතු ප්‍රමාණවත් නොවන කෙටීමේ ධාරිතාව හේතුකොට ගෙන, වී, සහල් ස්වභාවයෙන් ආහාර කොමසාරිස් වෙත යැවීම පමා වේ. එමනිසා මණ්ඩලයට වී සිය ගබඩාවල රාශිකර තබා ගැනීමට අවශ්‍යයෙන් සිදුවී ඇති අතර, ආහාර කොමසාරිස්ට සහල් ආනයනය කිරීමට සිදුවේ. තවද, මෙසේ වී ගබඩා ඉඩ ප්‍රමාණයන් අවහිර කොට තිබීමෙන් සහතික මිල ක්‍රමය යටතේ වී මිලදී ගැනීම ක්‍රමවත්ව සිදු නොවේ. මණ්ඩලය දැනටමත් සිය වී කෙටීමේ ධාරිතාව වැඩි කිරීමටත්, පෞද්ගලික අංශයට මූල්‍යාධාර සැපයීමෙන් ඔවුන්ගේ වී කෙටීමේ ධාරිතාව වැඩි කිරීමටත්, මූලික වැඩ පිළිවෙලක් පටන් ගෙන ඇත.

32472

**අතිරේක ආහාර භෝග සහ කිරි නිෂ්පාදනය**

මෑත අවුරුදු වලදී අතිරේක ආහාර භෝග යටතේ වගා වූ බිම් ප්‍රමාණය සහ නිෂ්පාදන-යෙහි දක්නට ලැබූ වැඩිවීමේ උපනතිය 1977 වගා වර්ෂයේදී ද දක්නට ලැබුණි. දත්තයන් ලැබී ඇති අතිරේක භෝග 16 ක් යටතේ වගා කොට තිබූ බිම් ප්‍රමාණය අවුරුද්ද තුළදී අක්කර 5,89,205 ක් වූ අතර, මෙම ප්‍රමාණය 1976 දී වගා කළ අක්කර ප්‍රමාණයට වඩා අක්කර 93,335 කින් හෝ සියයට 19 කින් වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙම භෝග 16 අතුරින් භෝග 13 කම වගා කළ අක්කර ප්‍රමාණයෙහි වැඩිවීමක් පෙන්වයි. ඉරිඟු, රට කජු, මුං ඇට, ඉදල් ඉරිඟු, සෝයා බෝංචි, බොම්බයි ලූණු, කුරක්කන්, තල, මෙනේරි, කව්පි, උඳු සහ පරිප්පු යන භෝගයන්හි නිෂ්පාදනය සැලකිය යුතු වැඩිවීමක් පෙන්වන අතර, අල වර්ග (මයියොක්කා, බතල සහ අර්තාපල්) යන්හි නිෂ්පාදනය අඩුවී ඇත. අල වර්ගවල නිෂ්පාදනය පහත වැටීමට හේතු වශයෙන් පෙන්විය හැක්කේ අධික සහන මිලට සලාකයට පිටි අවශ්‍ය තරම් ලබාගත හැකි වීමත්, විවෘත වෙළෙඳ පොලේ සහල් සැපයුම වැඩිවීමත්ය. අර්තාපල් පිළිබඳව මෙම අවුරුද්ද තුළදී බීජ අර්තාපල් හිඟයක්ද පැවතුණු බව සඳහන් කළ යුතුවේ.

ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවලට අනුව කිරි නිෂ්පාදනය 1976 දී පයින්ට් දශලක්ෂ 440 සිට 1977 දි පයින්ට් දශලක්ෂ 468 දක්වා වැඩිවිය. ජාතික කිරි මණ්ඩලයේ කිරි එකතු කිරීම 1976 දී පයින්ට් දශලක්ෂ 105 සිට 1977 දී පයින්ට් දශලක්ෂ 95.9 දක්වා පහත වැටුනි. කෙසේ වුවද, කිරි මණ්ඩලයෙහි මිලට ගැනීම් පහත බැසීමෙන් කිරි නිෂ්පාදනයේ පහත වැටීමක් පෙන්නුම් කරන අතර, මෙයට සත්ව ආහාර මිල වැඩිවීම බොහෝ දුරට හේතු වී ඇති බව කිව හැක.

**මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය**

මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන විශාලතම බහු කාර්ය ගංගා නිම්න සංවර්ධන යෝජනා ක්‍රමයයි. මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම පදනම් වී ඇත්තේ 1968 දී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙලේ සහ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ විශේෂඥ කණ්ඩායමක් විසින් සකස් කරන ලද ප්‍රධාන සැලැස්ම මතය. ප්‍රධාන සැලැස්මට අනුව අක්කර 9,00,000 ක් සඳහා වාරිමාර්ග පහසුකම් සැලසීමටත් මෙගවොට් 507 ක ස්ථාපිත ධාරිතාවකින් කිලොවොට් පැය දශලක්ෂ 2,037 ක ජල විදුලිබල උත්පාදන-යක් ඇති කිරීමටත් බලාපොරොත්තු වේ. අවුරුදු 30 ක කාලයකින් මෙම යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු නිම කිරීමට ප්‍රධාන සැලැස්ම අනුව නියමිත විය. මෙහි වැඩ කටයුතු සඳහා 1968 දී ඇස්තමේන්තු කළ ප්‍රාග්ධන වියදම රුපියල් දශලක්ෂ 5,583 කි.

මහවැලි ගඟ හැරවීමේ ඉදි කිරීම් කටයුතු 1970 දී ආරම්භ විය. පොල්ගොල්ල හා බෝවතැන්න සංකීර්ණයන්ගේ වැඩ කටයුතුත්, ඇලහැර අමුණ සහ ඇල වැඩිදියුණු කිරීම, සුදු ගඟ වැඩිදියුණු කිරීම ඇතුළු ප්‍රධාන වැඩ කටයුතුත්, 1976 දී සම්පූර්ණ කරන ලදී. කලා වැව සහ හුරුළු වැව විශාල කිරීම් සහ අළුත් ඉඩම් සංවර්ධනය කිරීම සම්බන්ධ වැඩ කටයුතු 1977 දී ක්‍රියාත්මක වෙමින් පැවතින. හරවන ලද මහවැලි ජලයෙන් මෙතෙක් ජල පහසුකම් ලැබූ අක්කර ප්‍රමාණය පහත සඳහන් සටහනින් පෙන්වයි.

**6 වැනි සංඛ්‍යා සටහන**

**මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම**
**1976/1978**

| වගා කරන ලද අක්කර ප්‍රමාණය | 1976 යල | 1976/77 මහ | 1977 යල | 1977/78* මහ |
|---|---|---|---|---|
| පරණ ඉඩම් .. .. | 89,716 | 145,790 | 130,675 | 134,142 |
| අළුත් ඉඩම් .. .. | 800 | 4,200 | 6,000 | 11,404 |
| එකතුව .. .. | 90,516 | 149,990 | 136,675 | 145,546 |

* තාවකාලික

මූලය: මහවැලි සංවර්ධන මණ්ඩලය

යෝජනා ක්‍රමයට අයත් ප්‍රදේශය තුල 1977 වසර අවසන් වන විට පවුල් 5,544 ක් පදිංචි කොට ඇත. පළමුවන අදියර යටතේ සංවර්ධන කටයුතු නිමවූ විට අළුත් ඉඩම් අක්කර 91,000 කට වාරිමාර්ග පහසුකම් සැලසෙනු ඇත.

මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයේ ප්‍රධාන සැලැස්මට අනුව තිබූ සියළුම වැඩ කටයුතු අවුරුදු 5 6 දක්වා කාලයක් තුලදී නිම කිරීමේ අදහසින් සංවර්ධන කටයුතු කඩිනම් කිරීමට 1977 නොවැම්බර් මාසයේදී රජය විසින් තීරණය කරන ලදී. මෑතම තොරතුරුවලින් පැහැදිලි වන අන්දමට රුපියල් දශලක්ෂ 11,000 ක සම්පූර්ණ ආයෝජනයකින් 1978-82 කාලය තුලදී ක්‍රියාත්මක කෙරෙන තවදුරටත් සංශෝධිත වැඩපිළිවෙලක් රජය විසින් අනුමත කර තිබේ.

## කාර්මික නිෂ්පාදනය

1977 දී, කාර්මික නිෂ්පාදනයෙහි මුලු වටිනාකම 1976 පැවති රුපියල් දශ ලක්ෂ 6061 සිට රුපියල් දශ ලක්ෂ 7004 දක්වා සියයට 16 කින් වැඩිවූ බව ඇස්තමේන්තු කෙරී ඇත. කෙසේ වූවද, මූර්ත වශයෙන් කාර්මික නිෂ්පාදනය ඉහළ ගියේ සියයට 1·3 කින් වන අතර, කර්මාන්තවල එකතු කළ අගය වැඩිවූයේ සියයට 1·1 කිනි. මේ හා සසඳන කල කාර්මික අංශයේ මූර්ත වර්ධනය 1975 දී සියයට 3·2 කින් ද, 1976 දී සියයට 1·2 කින් ද සිදුවී තිබුණි.

1976 දී නිමැවුමේ වර්ධනය සිදුවූයේ ප්‍රධාන වශයෙන්ම රාජ්‍ය අංශයේ කාර්මික සංස්ථාවල නිෂ්පාදනය තුළින් වුවද, 1977 දී සිදුවූ ඉහළයාම මූලික වශයෙන්ම පෞද්ගලික අංශය තුළින් සිදුවිය. 1977 දී පෞද්ගලික අංශයේ නිෂ්පාදනය ඉහල නැගී අතර, රාජ්‍ය අංශයේ කාර්මික සංස්ථාවල නිමැවුම පහලයාමක් දක්නට ලැබිණ. වැඩිපුර විදේශ විනිමය ලබාගත හැකිවීම පෞද්ගලික අංශයේ නිෂ්පාදනය ඉහළ මට්ටමකට පත්කිරීමට ඉවහල් වූ කරුණක් විය. දේශීය අමුද්‍රව්‍ය වඩා සුලභ වීමද එයට බලපෑ බව සංඛ්‍යා දත්ත වලින් පෙනීයයි.

**සංඛ්‍යා ලේඛන 7**

**කාර්මික නිෂ්පාදනයේ වටිනාකම 1975 – 1977**

| කාර්මික ගණය | නිෂ්පාදන වටිනාකම (රු: දශ ලක්ෂ) | | |
|---|---|---|---|
| | 1975 | 1976 | 1977 |
| 1· ආහාර පාන වර්ග හා දුම්කොළ .. .. | 1503 | 1715 | 2294 |
| 2· රෙදිපිළි ඇඳුම් හා සම්භාණ්ඩ .. .. | 892 | 680 | 698 |
| 3· දැව සහ දැව භාණ්ඩ (ගෘහභාණ්ඩ ඇතුලුව) .. | 115 | 129 | 127 |
| 4· කඩදාසි සහ කඩදාසි භාණ්ඩ .. .. | 270 | 203 | 270 |
| 5· රසායන ද්‍රව්‍ය, ඛණිජතෙල්, ගල්අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ .. .. | 2002 | 2336 | 2469 |
| 6· ලෝහ නොවන ඛනිජ භාණ්ඩ .. .. | 244 | 360 | 411 |
| 7· මූලික ලෝහ නිෂ්පාදන .. .. | 128 | 138 | 132 |
| 8· සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ .. .. | 381 | 474 | 571 |
| 9· අනිකුත් නිෂ්පාදන .. .. | 20 | 26 | 34 |
| 10· එකතුව .. .. | 5556 | 6061 | 7004 |
| 11· වර්ධනයේ මූර්ත අනුපාතය (%)·· .. | 3·2 | 1·2 | 1·3 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.